# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1947/34 - 2015 දෙසැම්බර් මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2015.12.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත**

57 වැනි වගන්තිය යටතේ නියෝගය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය, රංජිත් සියඹලාපිටිය වන මම ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇති මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම නියෝගය මගින් අනුමත කරමි.

රංජිත් සියඹලාපිටිය,
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 30 වැනි දින.

උපලේඛනය

ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, අධිකාරි පත්තුවේ කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ උඩුමුල්ල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ, උඩුමුල්ල ග්‍රාමයේ පිහිටියා වූ ද, මිල්ලගහවත්ත ඉඩම බලයලත් මිනින්දෝරු අයි. විජේකෝන් විසින් මැන සාදන ලද අංක 5/CEB/2015 හා 2015.12.03 දිනැති මානක සැලසුමේ ලොට් අංක 01 ලෙස නිරූපණය කර ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.01914 (පර්චස් 07.57) ක් වූ ඉඩමට මායිම් පහත දක්වෙන පරිදි වේ.

01. කැබලි අංක 01 ලෙස සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.01914, (පර්චස් 07.57)

| | | |
|---|---|---|
| උතුරට | : | එම ඉඩමේම ඉතිරි කොටස (ලොට් 04) ; |
| නැගෙනහිරට | : | එම ඉඩමේම ඉතිරි කොටස (ලොට් 04) ; |
| දකුණට | : | එම්. කේ. ඩී. එස්. ගුණසේකර හිමිකම් කියන ඉඩම සහ බලයලත් මිනින්දෝරු අයි. විජේකෝන් විසින් මැන සාදන ලද 2015.12.03 දිනැති අංක 5/CEB/2015 දරන මානක සැලසුමේ ලොට් අංක 02 සහ ලොට් අංක 03 ඉඩම් ; |
| බටහිරට | : | මුල්ලේරියාව පාරේ සිට තලාහේන පාර දක්වා පාර. |
| හිමිකම් කියන අය | : | එච්. අසෝකා කල්දේරා, 141/එච්, සෙත්සිරි මාවත, තලාහේන, මාලඹේ. |

01 - 571/1



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත**

57 වැනි වගන්තිය යටතේ නියෝගය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය, රංජිත් සියඹලාපිටිය වන මම ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇති මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම නියෝගය මගින් අනුමත කරමි.

රංජිත් සියඹලාපිටිය,
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 30 වැනි දින.

**උපලේඛනය**

ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, අඹතලෙන් පහල පත්තුවේ කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිංහපුර ග්‍රාම නිළධාරි කොට්ඨාශයේ, එගොඩ කොලොන්නාව ග්‍රාමයේ පිහිටියා වූ ද, ආලව කුඹුර හා ඕවිට සහ කහටගහවත්තෙවනාත ඉඩම බලයලත් මිනින්දෝරු අයි. විජේකෝන් විසින් මැන සාදන ලද අංක 10/CEB/2015 හා 2015.12.03 දිනැති මානක සැලසුමේ නිරූපණය කර ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.02793 (පර්චස් 11.04) ක් වූ ඉඩමට මායිම් පහත දැක්වෙන පරිදි වේ.

01. කැබලි අංක 01 ලෙස සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.02793, (පර්චස් 11.04)

| | | |
|---|---|---|
| උතුරට | : | කේ. සුනීතා දමයන්ති හිමිකම් කියන බලයලත් මිනින්දෝරු ආර්. ටී. අබේසිංහ විසින් මැන සාදන ලද 2000/07/08 දිනැති අංක 241 දරන මානක සැලසුමේ ආලව කුඹුර හා ඕවිට සහ කහටගහවත්තෙවනාත ඉඩමේ ලොට් අංක 01 ඉඩමේ ඉතිරි කොටස ; |
| නැගෙනහිරට | : | කේ. සුනීතා දමයන්ති හිමිකම් කියන බලයලත් මිනින්දෝරු ආර්. ටී. අබේසිංහ විසින් මැන සාදන ලද 2000/07/08 දිනැති අංක 241 දරන මානක සැලසුමේ ආලව කුඹුර හා ඕවිට සහ කහටගහවත්තෙවනාත ඉඩමේ ලොට් අංක 01 ඉඩමේ ඉතිරි කොටස සහ සුමනාරාමය පන්සලේ ඉඩම ; |
| දකුණට | : | සුමනාරාමය පන්සලේ ඉඩම ; |
| බටහිරට | : | සිංහපුර සාලවත්ත පාර. |
| හිමිකම් කියන අය | : | කේ. සුනීතා දමයන්ති, අංක 25/3, අයි. ඩී. එච්. පාර, කොලොන්නාව. |

01 - 571/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.